European Asylum, Migration and Integration Fund

European Reintegration Network

International Organization for Migration (IOM)
Organisation internationale pour les migrations (OIM)
Internationale Organisatie voor Migratie (IOM)

# යුරෝපීය ප්‍රතිසංකලන ජාලිය විශේෂිත ක්‍රියාකාරී වැඩසටහන- රටතුල ක්‍රියාත්මක අත් පත්‍රිකාව

(European Reintegration Network (ERIN) Specific Action – Country Leaflet)

## අත් පත්‍රිකාව

## ශ්‍රී ලංකාව

(ද්‍රවිඩ භාෂාවෙන්ද ලබාගත හැකිය)

ඔස්ට්‍රේලියාව, ඔස්ට්‍රියාව, බෙල්පියම, ඩෙන්මාර්කය, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, ඉතාලිය, ලක්සැම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, නෝර්වේ, රුමේනියාව, ස්පාඤ්ඤය ස්වීඩනය, ස්විස්ටර්ලන්තය හා එක්සත් රාජධානියේ සිට ආපසු පැමිණෙන ශ්‍රී ලාංකිකයින් සඳහා එරින් විශේෂිත ක්‍රියාකාරී වැඩසටහන තුලින් ප්‍රතිලාභ ලබා ගැනිම සඳහා එරින් ව්‍යාපෘතිය හා සම්බන්ධ රටකින් හෝ නැවත පැමිනීමෙන් පසු තම රටෙහි IOM කාර්‍යාලයෙන් ප්‍රතිසංකලන සහය සඳහා ඉල්ලුම් කිරීමට පිළිවන.

## අයදුම්කිරීම හා යෝග්‍යතාව

ඔස්ට්‍රේලියාව, ඔස්ට්‍රියාව, බෙල්පියම, ඩෙන්මාර්කය, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, ඉතාලිය, ලක්සැම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, නෝර්වේ, රුමේනියාව, ස්පාඤ්ඤය ස්වීඩනය, ස්විස්ටර්ලන්තය හා එක්සත් රාජධානියේ සිට ශ්‍රී ලංකාවට ආපසු පැමිණෙන යුරෝපිය ප්‍රතිසංකලන ජාලිය විශේෂිත ක්‍රියාකාරී වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබාගනු රිසි ශ්‍රී ලාංකිකයින්ට ඒ සඳහා තමන් දැනට සිටින යුරෝපිය රටේ යුරෝපිය ප්‍රතිසංකලන ජාලිය ්‍යශේෂිත ක්‍රියාකාරී වැඩසටහනේ නියෝජිත ආයතනය වෙත හෝ ආපසු සියරට පැමිණි පසු සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ දේශිය කාර්යාලය වෙත අයදුම් කළ හැකිය.

එසේ ප්‍රතිලාභ ලැබීමට ඇති යෝග්‍යතාවය අදාල රටෙන් පිට වීමට මත්තෙන් අදාල වග කිව යුතු යුරෝපීය හවුල්කාර ආයතනය විසින් විනිශ්චය කිරීම හෝ තම ජන්ම දේශයට අදාල පුද්ගලයා සම්ප්‍රාප්ත වීමෙන් අනතුරුව එම යුරෝපීය හවුල්කාර ආයතන විසින් තහවුරු කිරීම කළ හැකිය. මෙම තහවුරු කිරීම සඳහා ආපසු පැමිණි පුද්ගලයා තම ආපසු පැමිනීමෙන් පසු හැකි තාක් ඉක්මනින් සිය රටේ ඇති ‘‘සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ’’ දූත මණ්ඩලය හා සම්බන්ධ විය යුතුය. ඉන් පසු සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය හා එරින් යුරෝපීය හවුල්කාර ආයතනය හා සම්බන්ධ වනු ඇති අතර එම ආයතනය නිවැරදිතාවය පිරික්සීමේ කටයුත්ත සිදු කරනු ඇත. වැඩසටහනට සම්බන්ධ වීමට ඔබ තුළ ඇති යෝග්‍යතාවය යුරෝපීය හවුල්කාර ආයතනය විසින් තහවුරු කරනු ලැබීමෙන් අනතුරුව ප්‍රතිසංකලන සඳහා ඔබට සහාය වීම ආරම්භ කිරීමේ හැකියාව සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයට ලැබෙනු ඇත.

## සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ (IOM) මෙහෙවර ප්‍රකාශය.

සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) මානව හා ක්‍රමවත් සංක්‍රමණය සංක්‍රමණිකයන් හා සමාජය යන දෙකටම ප්‍රතිලාභි වන්නේය යන මූල ධර්මයට කැප වී සිටී. 1951 වර්ෂයේදී සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) පිහිටුවන ලද්දේ සංක්‍රමණය කළමනාකරණය කිරීමට රජයයන්ට සහාය වීමට හා සංක්‍රමණිකයින්ට සංක්‍රමණ ක්‍රියාවලියෙහි ලා උදවු කිරීමටය. ලෝකය පුරා පිහිටි කාර්යාලයයන් හා නියෝජනයන් 481 කින් හා සාමාජික රාජ්‍යයන් 165 කින් සමන්විත එය අද වන විට ලෝකයෙහි සංක්‍රමණ ක්ෂෙත්‍රයෙහි ඇති ප්‍රධාන අන්තර්රාජ්‍ය සංවිධානය වන්නේය. වෙනත් ක්‍රියාකාරකම් අතර එහි වසර 30 ක පළපුරුද්ද තුළින් සංවර්ධනය කරගනු ලැබ ඇති ප්‍රවීණතාවයක් වන 'සහායික ස්වේච්ඡා ප්‍රතිසම්ප්‍රාප්ති හා පතිසංකලන වැඩසටහන (AVRR)' යටතේ ආපසු සිය රට පැමිණ නව ජීවිතයක් ගොඩනගා ගැනීම පිණිස ලොව පුරා සිටින ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන්ට සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) සහාය වෙයි.

සංක්‍රමණයට අදාලව වර්ධනය වෙමින් පවතින මෙහෙයුම් අභියෝගයන්ට මුහුණ දීමට සහාය වීම සඳහාද, සංක්‍රමණ ගැටළු වේලාසන අවබෝධ කරගැනීම සඳහාද, සංක්‍රමණය හරහා සමාජයීය හා ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කරගැනීම දිරිමත් කිරීම සඳහා හා සංක්‍රමණිකයින්ගේ යහ පැවැත්ම හා මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහාද සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) ජාත්‍යන්තර ප්‍රජාව තුළ සිටින සිය පාර්ශවකරුවන් සමග එක් වී කටයුතු කරයි.

## ප්‍රතිසම්ප්‍රාප්ති හා ප්‍රතිසංකලන සහාය

(ජාතික ඇමුණුමේ වෙනස් අයුරකින් සඳහන් කරනු ලැබ තිබුනොත් හැර ප්‍රතිසංකලන සහායක පැකේජය ලබා දෙන්නේ ද්‍රව්‍ය වශයෙන් වන අතර එසේ දෙන ප්‍රමාණයන් එවනු ලබන රට, ජාතික ප්‍රතිසංකලන ප්‍රදාන, ආපසු පැමිණීමේ ස්වභාවය, ප්‍රතිලාභියාගේ ප්‍රතිරූපය හා අවශ්‍යතා අනුව වෙනස් වේ. භාරකරුවෙකු නොමැතිව ගමන් කරන බාල වයස්කරුවන් වෙත අතිරේක ප්‍රතිසංකලන සේවා සපයනු ලැබේ.

නැවත තම රටට පැමිණීමෙන් පසුව සිදුකරනු ලබන පිරික්සුමෙන්, අගැයීමෙන් පසු එරින් හවුල්කාර ආයතනයේ අනුමැතියෙන් ලබා ගැනීම මෙන්ම" සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය විසින් තව දුරටත් සිදු කරනු ලබන අවශ්‍යතා හඳුනාගැනීමකින් පසුව එරින් ප්‍රතිසංකලන ජාලිය ṅශේෂිත ක්‍රියාකාරී වැඩසටහනේ ප්‍රතිලාභීන් හට තනි තනි පදනමක් මත පහත සඳහන් සේවා ලබාගත හැකි වේ :

### එක් එක් අයෙකුට ගුවන් තොටට සම්ප්‍රාප්ත වීමේදී ලැබෙන සහාය

**පිටත් වීමට පෙර ඉල්ලා සිටි විට පහත සේවාවන් සැපැයිය හැකි වේ:**

- පිළිගැනීම, සුභ පැතීම හා දිශානුයෝජනය
- ප්‍රවාහන පහසුකම් සහාය
- වෛද්‍ය ප්‍රතිකාර අඛන්ඩත්වය සඳහා වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම්
- හදිසි තාවකාලික නවාතැන් පහසුකම්.

## ප්‍රතිසංකලන සහාය.

රටපුරා ඇති සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධාන කාර්යාලයන්ට අනුයුක්ත සුදුසුකම් ලත් කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් පශ්චාත් සම්ප්‍රාප්ති ප්‍රතිසංකලන උපදේශන ලබා දෙනු ඇත. සංක්‍රමණය සඳහා ජාත්‍යන්තර සංවිධානයට අනුයුක්ත ප්‍රතිසංකලන උපදේශකයින් විසින් ආපසු පැමිණියවුන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් ප්‍රතිසංකලන අවස්ථාවන් පිළිබඳව දැනුවත් කරනු ලබන අතර ඔවුන්ගේ ප්‍රතිසංකලන ක්‍රමෝපාය සැලැසුම් කිරීමටද, තමන්ගේ අවශ්‍යතා හා පසුබිමද, එමෙන්ම ලබාගැනීමට හැකි සම්පත්ද (එනම් ප්‍රකාශිත ප්‍රදානයන්, පෞද්ගලික හැකියාවන්, හා සමාජ හා ආර්ථික ප්‍රාග්ධනයන්) සැලැකිල්ලට ගනිමින් තමන්ට

ලැබෙන ප්‍රතිසංකලන ප්‍රදානය ඉතාම ඥානාන්විත හා නිර්මාණාත්මක ආකාරයට වැය කිරීම පිළිබඳවද ඔවුනට උපදෙස් දෙනු ඇත.

ප්‍රතිසංකලාන ප්‍රදානයන් පහත සඳහන් ප්‍රතිසංකලන සේවාවන් සඳහා යොදාගත හැකි වේ:

**ක්ෂුද්‍ර ව්‍යාපාර සඳහා සහාය:** ආර්ථික ස්වාධීනත්වය හා ආදායම් උත්පාදනය සඳහා ක්ෂුද්‍ර ව්‍යාපාර ක්‍රියාකාරකමක් ආරම්භ කිරීමට, නැවත ආරම්භ කිරීමට හෝ එවැනි ව්‍යාපාරයකට හවුල් වීමට. ඔබගේම ව්‍යාපාරයක් දියත් කිරීමට ඔබ අදහස් කරන්නේනම් සුදුසු ව්‍යාපාර වර්ගයක් හඳුනාගැනීමට IOM ඔබට සහාය වනු ඇත. ව්‍යාපාරයක් තෝරාගැනීම වෙනත් කරුණු අතර ඔබගේ පළපුරුද්ද හා ඔබ ආපසු සම්ප්‍රාප්ත වී ඇති ප්‍රදේශයේ ඇති වෙනත් ව්‍යාපාර මත පදනම් වනු ඇත.

**රැකියා දිරිමත් කිරීම සඳහා වේතන සහනාධාර දීමනාව:** සිය හවුල්කාර ජාලය හරහා ඔබ විභව සේව්‍යයන් වෙත යොමු කිරීමට හා අදාල බඳවාගැනීම් වෙබ් ලිපිනයන් ක්‍රියාත්මක කිරීමට ඔබට පෙන්වා දීමටත් ශ්‍රී ලංකාවේ සංක්‍රමණ සඳහා වන ජාත්‍යන්තර සංවිධානයට හැකියාව තිබේ. ඔබට රැකියාවක් ලැබුණහොත් වේතන සහනා:ධාරයක්/වේතන වර්ධනයක් වශයෙන් ඔබේ ප්‍රතිසමෝධාන සහාය මුදා හරිනු ඇත.

**කුසලතා වර්ධනයට හා රැකියා ලබාගැනීමේ හැකියාව නංවා ලීමට වෘත්තිය පුහුණුවට යොමු කිරීම:** හැකියාව, පෙර වැඩ පළපුරුද්ද, අධ්‍යාපනය, උනන්දුව හා විශේෂිත කුසලතාවයන් කෙරෙහි දේශීය වෙළෙඳපොලෙහි ඇති ඉල්ලුම පදනම්ව පුහුණුව හඳුනාගත හැකිය.

ළමයින් සඳහා අධ්‍යාපන හා පාසැල් වියදම් හා අවශ්‍ය එන්නත් හා වෛද්‍ය ආරක්ෂණය.

**තාවකාලික නවාතැන් පහසුකම්.** පැන නැගෙන අවශ්‍යතාවය මත තාවකාලික නවාතැන් පහසුකම් ලබා ගැනීමට සහයවීම.

ආපසු පැමිණීමෙන් පසු සෞඛ්‍යාරක්ෂණය ලබා ගැනීමේ හැකියාව ඇති කිරීම සඳහා **වෛද්‍ය ගාස්තු** ආවරණය (ඖෂධ, වෛද්‍ය උපදෙස්)

දේශීයව ලියාපදිංචි වීමේ හැකියාව ඔබට ඇති කිරීම සඳහා **නෛතික/පරිපාලන පිරිවැය.**

## පරිපාලන සහාය හා යොමු කිරීම්:

පහත සඳහන් පරිදි ඔබ වෙත පරිපාලන සහාය ලබා දීමට හා ඔබව යොමු කිරීමට සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානයට හැකියාව තිබේ:

- අන්තර්ජාතික, කලාපීය හා ප්‍රාදේශීය සේවා (රාජ්‍ය, රාජ්‍ය නොවන, පුද්ගලික අංශය)
- දේශීය රැකියා ආරම්භක ක්‍රියා
- ක්ෂුද්‍ර මූල්‍ය සංවිධාන
- පාසැල් වලට හා අධ්‍යාපනික ආයතනයන්ට ඇතුළත්වීම
- අධ්‍යාපනික හා වෘත්තිය පුහුණුව
- විශේෂිත වෛද්‍ය ආධාර
- මනෝ-සමාජයීය සහාය : ශ්‍රී ලංකාවේ සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ කාර්ය මණ්ඩලය මේ සඳහා විශේෂඥ උපදේශක වරයකු විසින් පුහුණු කරනු ලැබ ඇත.
- දේශීය සමාජ ජාලය
- නෛතික උපදෙස්

## නැවත පැමිණීමෙන් පසු ප්‍රතිලාභියා සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධාන කාර්යාලය හා සම්බන්ධ විය යුතු වේ

**ERIN වෙබ් අඩවිය:**
http://erin-iom.belgium.iom.int

**ERIN IOM හා ශ්‍රී ලංකාවේද සම්බන්ධ වීමට:**


ප්‍රියන්ත කුලතුංග මහතා
වැඩසටහන් කළමනාකරු
සඳුදා සිට සිකුරාදා දක්වා පැය 08.30 සිට පැය 17.00 දක්වා ඇමතිය හැකිය.

විද්‍යුත් තැපැල: MKULATUNGE@iom.int
දුරකථන: +94 11 5325 310; Fax: +94 11 5325 302

**ලිපිනය:**
සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය
62, ග්‍රීන් පාත්, ආනන්ද කුමාරස්වාමි මාවත
කොළඹ 3 - ශ්‍රී ලංකාව


**වැඩි විස්තර සඳහා ශ්‍රී ලංකාව පිළිබඳ එරින් උපදෙස් පත්‍රිකාව බලන්න**

## ERIN අනුග්‍රාහකයින්

එරින් සඳහා 90% ක් අරමුදල් සපයනු ලබන්නේ යුරෝපා හවුල්කාර ආයතනය (යුරෝපීය සරණාගත, සංක්‍රමණ හා ඒකාබද්ධ අරමුදල- විශේෂ ක්‍රියාකාර කම්) මෙන්ම යුරෝපීය රාජ්‍යයන් 18 සහභාගීත්වයෙන්ය (ඕස්ට්‍රේලියාව, ඕස්ට්‍රියාව, බෙල්ජියම, ඩෙන්මාර්කය, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, ඉතාලිය, ලක්සැම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, නෝර්වේ, රුමේනියාව, ස්පාඤ්ඤය ස්විඩනය, ස්විස්ටර්ලන්තය හා එක්සත් රාජධානිය).

වැඩසටහන ඉදිරිපත් කරනු ලබන්නේ යුරෝපීය හවුල්කාර ආයතන 19 මගින්ය.

| S.N | ERIN Partner Countries | S.N | ERIN Partner Institutions |
|---|---|---|---|
| 1 | ඕස්ට්‍රියාව | 1 | අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය<br>Ministry of Interior |
| 2 | ඕස්ට්‍රේලියාව | 2 | ආගමන සහ දේශ සීමා ආරක්ෂණ දෙපාර්තුමේන්තුව<br>Department of Immigration and Border Protection |
| 3 | බෙල්ජියම | 3 | ෆෙඩරල් ආගමන විගමන කාර්යාලය<br>Federal Immigration Office |
| | | 4 | රැකවරණය පතන්නන් පිළිබඳ ෆෙඩරල් ආයතනය<br>Federal Agency for the Reception of Asylum Seekers |
| 4 | ඩෙන්මාර්කය | 5 | විදේශ කටයුතු අමාත්‍යාංශය<br>Ministry of Foreign Affairs |
| 5 | ෆින්ලන්තය | 6 | ෆින්ලන්තයානු ආගමන විගමන සේවාව<br>Finnish Immigration Service |
| 6 | ප්‍රංශය | 7 | ප්‍රංශ ආගමන සහ ඒකාබද්ධතා කාර්යාලය<br>French Immigration and Integration Office |
| 7 | ජර්මනිය | 8 | සංක්‍රමණිකන් සහ සරණාගතයන් සඳහා වන ෆෙඩරල් කාර්යාලය<br>Federal Office for Migration and Refugee |
| 8 | ග්‍රීසිය | 9 | මහජන සාමය සහ පුරවැසි ආරක්ෂක අමාත්‍යාංශය<br>Ministry of Public Order and Citizen Protection |
| 9 | ඉතාලිය | 10 | අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය<br>Ministry of Interior |
| 10 | ලක්සම්බර්ග් | 11 | යුරෝපීය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය<br>Ministry of European and Foreign Affairs |
| 11 | මෝල්ටාව | 12 | ස්වදේශ කටයුතු සහ ජාතික ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශය<br>Ministry for Home Affairs and National Security |
| 12 | නෙදර්ලන්තය | 13 | නැවත තමරටට ගෙන්වා ගැනීම සහ පිටවීමේ සේවාව<br>Repatriation and Departure Service |
| 13 | නෝර්වේ | 14 | ආගමනිකයන් සඳහා වන නෝර්වේජියානු අධ්‍යක්ෂක මණ්ඩලය<br>Norwegian Directorate of Immigration |
| 14 | රුමේනියාව | 15 | ආගමනිකයන් සඳහා වන සාමාන්‍ය පරීක්ෂක මණ්ඩලය<br>General Inspectorate for Immigration |
| 15 | ස්පාඤ්ඤය | 16 | සංක්‍රමණියන් සඳහා වන ඒකාබද්ධ සංක්‍රමණික මණ්ඩලය<br>Integration of Immigrants Migration Board |
| 16 | ස්විඩනය | 17 | ස්විඩන් සංක්‍රමණ නියෝජිතායතනය<br>Swedish Migration Agency |
| 17 | ස්විස්ටර්ලන්තය | 18 | සංක්‍රමණය සඳහා වන රාජ්‍ය ලේකම්<br>State Secretariat for Migration |
| 18 | එක්සත් රාජධානිය | 19 | ආගමන බලාත්මක කිරීමේ කාර්යාලය<br>Home Office – Immigration Enforcement |